ව්‍යාපාර අදහස් හා අවස්ථා

ව්‍යාපර අදයසක් යනු

පරිසරයෙ ඇති ගැටලුවකට විසඳුමක් වන පුද්ගල අවශ්‍යතා හා වුවමනා සපුරාලන වාණිජමය වටිනාකමක් ඇති සිතවිල්ලකි.

මේ අනුව මිනිස් සිත තුල හටගන්නා දහසකුත් එකක් සිතිවිලි අතරින් යම් අදහසක් ව්‍යාපාර අදහසක් වීමට නම් එම අදහස් තුලින් පහතදෑ සියල්ල ඉටුවිය යුතුවේ.

- 1.එම අදහස් අහස තුලින් පරිසරයේ ඇති ගැටලුවකට විසදුමක් ලැබීම.
- 2.පුද්ගල අවශ්‍යතා හා වුවමනා සපුරාලීමක් සිදුවීම.
- 3.වාණිජමය වටිනාකමක් පැවතීම.

මෙම කරුණු තුනම ඉටුවන තත්ත්වයක් තුල ඕනෑම පුද්ගලයෙකුගේ සිතෙහි ව්‍යාපාර අදහසක් ඇතිවෙන්නට පුළුවන් එවැනි ව්‍යාපාර අදහස් අසීමිතය කිවහොත් අප නිවැරැදි . එසේත් නැත්නම් ව්‍යාපාර අදහස් සුලබයි කියන්න අපිට පුළුවන් .

හැබැයි මෙම සෑම ව්‍යාපාර අදහසක්ම ව්‍යාපාර අවස්ථාවක් බවට පත්කර ගන්නට අපිට බැහැ. එහෙම කරගන්නට හැක්කේ හොඳ ව්‍යාපාර අදහස් පමණි.

හොඳ ව්‍යාපාර අදහසක සුවිශේෂී ලක්ෂණ සමූහයක් දක්නට තිබේ .මෙම ලක්ෂණ පහත ආකාරයෙන් හදුනාගන්න පුලුවන්.

හොඳ ව්‍යාපාර අදහසක ලක්ෂණ .

1.ව්‍යාපාරයක් ලෙස සංවර්ධනය කළ හැකි වීම
2.පරිසරයේ මතු වන අවශ්‍යතා සපුරාලිය හැකි වීම.
3.වෙනස් වන අවශ්‍යතා හා වුවමනාවලට ප්‍රතිචාර දැක්විය හැකි වීම .
4.තරගකාරීත්වයටසාර්තකව මුහුනදිය හැකි වීම .
5.තාක්ෂණය සමග ගැළපිය යුතු වීම .
6.මුහුණ දෙන අවදානම අවම කරගත හැකි වීම .
7.ව්‍යාපාරයක් බවට පරිවර්තනය කිරීමෙන් ඉපැයීමක් කළ හැකි වීම .
8.ස්වකීය ව්‍යාපාර අදහස ආරක්ෂා කරගත හැකි වීම .

අප සිත තුල ව්‍යාපාර අදහස් විවිධාකාරයෙන් ඇති වෙන්න පුළුවන්.ඒකියන්නේ විවිධ මූලාශ්‍ර තුලින් ව්‍යාපාර අදහස් මතුවෙන්නට පුලුවන් .ඒවා අතරින් ප්‍රධාන මූලාශ්‍ර පහත ආකාරයෙන් දැක්විය හැකිය .

ව්‍යාපාර අදහස් මූලාශ්‍ර .

1.විනෝදාංශ හා ලැදියා තුළින් .
2.පුද්ගල දක්ෂතා හා පළපුරුද්ද තුළින් .
3.වෙළෙඳපොළ සමීක්ෂණ තුළින් .
4.පාරිභෝගික ප්‍රතිචාර තුළින් .
5.නිර්මාණශීලි චින්තක හැකියාව තුළින් .
6.ජනමාධ්‍ය තුළින් .
7.සැපයුම්කරුවන් ඇසුරින් .
8.තරගකාරීත්වය අධ්‍යනය කිරීම තුළින් .
9.අධ්‍යාපනික පාඨමාලා තුළින් .
10.ප්‍රදර්ශන හා අත්දැකීම් මගින් .

ව්‍යාපාර අවස්ථා

“ව්‍යාපාර අවස්ථාවක් යනු

අවදානම භාරගත් පුද්ගලයාට ප්‍රමාණවත් ප්‍රතිලාභයක් අත්කරදීමේ හැකියාව ඇති ආකර්ෂණීය ආයෝජන අදහසකි.

එබැවින් ව්‍යාපාර අවස්ථාවක් බවට පත්කරකරගත හැක්කේ හොඳ ව්‍යාපාර අදහසකින් පමණි .

ව්‍යාපාර අවස්ථා හා ව්‍යාපාර අදහස් අතර පැහැදිලි වෙනසක් දක්නට ඇත.එම වෙනස්කම් අපට පහත ආකාරයට පෙන්වා දිය හැකිය .

ව්‍යාපාර අදහස	ව්‍යාපාර අවස්ථා
ව්‍යාපාර අදහස් සුලභය. විවිධ මූලාශ්‍රය ඔස්සේ විශාල ප්‍රමාණයක් ව්‍යාපාර අදහස් ජනනය කරගත හැකි ය.	ව්‍යාපාර අවස්ථා සුලභ නොවේ. ව්‍යාපාර අදහස් සිය ගණනකින් තෝරා ගත හැක්කේ ව්‍යාපාර අවස්ථා කිහිපයකි.
ව්‍යාපාර අදහස් විවෘත ය. බොහෝ අය ඒවා දකිති.	ව්‍යපාර අදහස් අතුරින් ව්‍යාපාර අවස්ථා අනාවරණය කර ගැනීම සියල්ලන්ට ම කළ නොහැකි ය.
සෑම ව්‍යාපාර අදහසක් ම ප්‍රායෝගික ව ක්‍රියාවට නැංවිය නොහැකි ය.	ව්‍යාපාර අවස්ථාව ප්‍රායෝගික ව ක්‍රියාවට නැංවිය හැකි ය.

ඉල්ලුමක් පැවතීම
අවශ්‍ය සම්පත් සපයාගත හැකි වීම
හොඳ ව්‍යාපාර අවස්ථාවක්
ආකර්ෂණීය ඉපැයුමක් තිබීම
නීති රීතිවලට අනුකූල වීම
තරගකාරීත්වයට මුහුණ දිය හැකි වීම

යෝගය ව්‍යාපාර අවස්ථාවක් තෝරා ගැනීම

මේ සඳහා ව්‍යාපාර අදහස් ඇගයීමට ලක් කළ යුතු අතර එය පියවර තුනකින් යුතු ක්‍රියාවලියක් හරහා සිදුවේ.

පියවර1- සර්ව විශ්ලේෂණය මෙහිදී .

අදහස් විශාල ප්‍රමාණයක් අතරින් හොඳම ව්‍යාපාර අදහසක් 10ක් තෝරා ගනී .

පියවර2-සූක්ෂම විශ්ලේෂණය මෙහිදී .

පළමු පියවරේදී තෝරාගත් ව්‍යාපාර අදහස් 10 අතරින් හොඳම ව්‍යාපාර අදහස් 3 තෝරාගනී.

පියවර3-ශටුඅත විශ්ලේෂණය මෙහිදී .

මෙහිදී දෙවන පියවරේදී තෝරාගත් ව්‍යාපාර අදහසක් තුන අතරින් හොඳම ව්‍යාපාර අදහස තෝරාගනී .

මෙම ක්‍රියාවලිය තුල සර්ව විශ්ලේෂණයේදී සියලු ව්‍යාපාර අදහස් පිළිබඳව පහත සාධක(නිර්නායක)යටතේ මතුපිටින් සලකාබැලීමක් සිදුවේ .

සූක්ශම විශ්ලේෂණයේදී පහත නිර්නායක යටතේ ව්‍යාපාර අදහස් 10 ගැඹුරින් අධ්‍යනයක් කිරීමක් සිදුකරන අතර එහිදී තක්සේරු ලකුණු පරිමාණ වගුවකට ඇතුලත් කරඇගයීමට ලක්කරයි.

ලකුණු පරිමාණ භාවිතයට මග පෙන්වීම්	
නිදසුන් ලෙස **අමුද්‍රව්‍ය සපයා ගැනීම යන සාධකය** අගයමු.	
නිර්ණායක	**ලකුණු**
පිරිවැයක් නොමැති ව ආසන්නයෙන් සපයා ගතහැකි නම්	ලකුණු 5
ආසන්නයෙන් මිල දී ගත හැකි නම්	ලකුණු 4
නගරයෙන් මිල දී ගෙන ප්‍රවාහනය කරගත හැකි නම්	ලකුණු 3
ආනයනය කර ගත යුතු නම්	ලකුණු 2
නෛතික බලපෑම් වැඩි නම්	ලකුණු 1

මේ අනුව ඕනෑ ම සාධකයක් ඇගයීම සඳහා පහත දක්වෙන පොදු ලකුණු පරිමාණය භාවිත කළ හැකි ය.

තක්සේරුව	ඉතා හොඳයි	හොඳයි	සතුටුදායකයි	සාමාන්‍යයි	දුර්වලයි
ලකුණු පරිමාණය	05	04	03	02	01

මේ අයුරින් සියලු සාධක වෙන වෙන ම සැලකිල්ලට ගෙන ව්‍යාපාර අදහස් ඇගයීම සඳහා පහත දැක්වෙන ආකාරයේ ව්‍යාපාර අදහස් තක්සේරු පත්‍රයක් පිළියෙල කර ගත හැකි ය.

ව්‍යාපාර අදහස් තක්සේරු පත්‍රය

ව්‍යාපාර අදහස	වෙළඳ පල	අමුද්‍රව්‍ය	ශ්‍රමය	තාක්ෂණය	ඉපැයීම	අවදානම	තරගය	රාජ්‍ය අනුග්‍රහය	මුළු ලකුණු
1............ 2. 3. 4.	4	5	3	4	3	3	3	3	28

සූක්ෂම විශ්ලේෂණයට යොමු කළ ව්‍යාපාර අදහස් (10) සඳහා සලකා බලන නිර්ණායක යටතේ ලබාදුන් තක්සේරුවට අදළ ලකුණු එකතු කොට වැඩි ම ලකුණු උපයා ගත් ව්‍යාපාර අදහස් 03ක් පමණ තෝරා ගැනීමට හැකියාව මේ පියවර අවසානයේ දී ඔබට ලැබෙනු ඇත.

ශදුඅත විශ්ලේෂණයේදී තෝරාගත් ව්‍යාපාර අදහස් තුනෙහි ශක්ති,දුර්වලතා ,අවස්ථා හා තර්ජන පිළිබඳව අධ්‍යනය කරයි.

ශක්ති
දුර්වලතා
අවස්ථා
තර්ජන

ශ.දු.අ.ත.විශ්ලේෂණය .

ශදුඅත විශ්ලේෂණයක යෙදෙනවිට භාවිතා කළහැකි සාධක කීපයක් පහත දැක්වේ.


අදහස් සිය දහස් ගණනක්
සාර්ව විශ්ලේෂණය
ව්‍යාපාර අදහස් 10 පමණ
සූක්ෂම විශ්ලේෂණය
ව්‍යාපාර අදහස් 03 පමණ
ශඳුඅත විශ්ලේෂණය
හොඳ ම ව්‍යාපාර අදහස

මෙයට අනුව පොදුවේ ගත්කල ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයට අයත් වාසිදායක සාධක වන්නේ ව්‍යාපාරයේ ශක්තීන්ය.
උදා-1.දක්ෂ සේවකයන් සිටීම.

එහි අවාසිදායක සාධක වන්නේ දුර්වලතාවන්ය.

උදා-1.අමුද්‍රව්‍ය හිග වීම.

බාහිර පරිසරයේ වාසිදායක සාධක අවස්ථාවන් ය.

උදා-1.රජයේ දිරිගැන්වීම් .

ව්‍යාපාරයට බාහිර පරිසරයේ අවාසිදායක සාධක වන්නේ තර්ජනයන් ය.

උදා-1.අන්වශ්‍ය දේශපාලන මැදිහත් වීම්.

පහත සදහන් ශදුඅත විශ්ලේෂණයට අනුව කිනම් අංශයට අයත් සාධකයක් දැයි හදුනාගන්න .

1.මූල්‍ය ස්ථාවරත්ක් තිබීම .
2.රටේ ආර්ථිකය අයහපත් වීම .
3.පාරිභෝගික පිරිස වැඩි වීම .
4.යල්පැන ගිය තාක්ෂණය භාවිතය .

ඉහත සාධක අතරින් .

1.ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයට අයත් ශක්තිය කි.
2.ව්‍යාපාරයේ බාහිර පරිසරයට අයත් තර්ජනයකි.
3.ව්‍යාපාරයක අබ්‍යන්තර පරිසරයට අයත් අවස්ථාවකි.
4ව්‍යාපාරයක අබ්‍යන්තර පරිසරයට අයත් දුර්වලතාවයකි.

	වාසිදායක සාධක	අවාසිදායක සාධක
අභ්‍යන්තර පරිසරය	**ශක්ති Strengths** නිදසුන් :- ★ සම්පත් පැවතීම ★ දක්ෂ සේවකයන් සිටීම ★ නිෂ්පාදිතවල ඉහළ ගුණත්වය ★ මූල්‍ය ස්ථාවරත්වය	**දුර්වලතා Weaknesses** නිදසුන් :- ★ මූල්‍ය දුෂ්කරතා ★ යල්පැන ගිය තාක්ෂණය ★ අමු ද්‍රව්‍ය හිඟ වීම ★ සේවක කැපවීම අඩු වීම
බාහිර පරිසරය	**අවස්ථා - Opportunities** නිදසුන් :- ★ වැඩි පාරිභෝගික පිරිසක් සිටීම ★ තරගකරුවන් ඉවත් වීම ★ තාක්ෂණය දියුණු වීම ★ පර්යේෂණ හා සංවර්ධනයක් පැවතීම ★ රාජ්‍ය දිරි ගැන්වීම්	**තර්ජන - Threats** නිදසුන් :- ★ අනවශ්‍ය දේශපාලන මැදිහත් වීම ★ අවාසිදායක නීති රීති පැනවීම ★ ස්වභාවික ආපද හා විපත් නිරන්තර ව පැමිණීම ★ ආර්ථිකය අයහපත් වීම

මේ ආකාරයෙන් නිර්මාණාත්මකව යම් ව්‍යවසායකයෙකු සොයාගන්නා නව ව්‍යාපාර අදහසක් වෙනත් අයෙකු අත්පත් කරගැනීම වලකාගැනීමට පේටන්ට් බලපත්‍රයක් ලබාගැනීමෙන් හැකිවේ.

ඒ අනුව පේටන්ට් බලපත්‍රයක් නැතහොත් ස්වාධිකාරයක් යනු නව සොයාගැනීමක් වෙනුවෙන් ලබාදෙන රජයේ සහතිකයයි.

මෙහිදී නව සොයාගනීමක් ලෙස සැලකෙන්නේ

1.නව නිමැයුමක්.
2.නව යන්ත්‍රයක් .ඒ
3.නව ක්‍රියාවලියක්.
4.ඉහත කරුනුවල සංකලනයක්.
5.පවත්නා සොයාගැනීමක වැඩිදියුණු කිරීමකි.

පේටන්ට් බලපත්‍රයක වලංගුකාලය වසර 20 කි.

ඉන් අදහසක් වන්නේ නව සොයාගැනීම වසර 20ක් යනතුරු අන් කිසිවෙකුට උපුටා ගත නොහැකි බවයි.
අවශ්‍යනම් තමාලබාගත් පේටන්ට් බලපත්‍රය තවත් ව්‍යාපාරිකෙයකුට අලෙවිකළ හැකිය.
එවිට එහිඅයිතිය මිලදීගත් අය සතු වෙයි.

හොඳයි දරුවනේ ඔබ ඉහත ක්‍රමවේද අනුගමනය කළහොත් පහතෙරූපයේ දැක්වෙන පරිදි ව්‍යවසායකයෙකු ලෙස දිගුගමනක් ගමන් කරමින් ඔබේත් රටේත් දියුනුව උදෙසා විශාල මෙහෙවරක් කිරීමට හැකියාව ලැබෙයි.



පිළිතුරු ලියමු.

01. ව්‍යාපාර අදහස් හා ව්‍යාපාර අවස්ථා අතර වෙනස්කම් දක්වන්න.

02. ව්‍යාපාර අදහස් ජනනය වන මූලාශ්‍ර කවරේ ද?

03. හොඳ ව්‍යාපාර අවස්ථාවක ලක්ෂණ දක්වන්න

04. ව්‍යාපාර අදහස් අතරින් යෝග්‍ය ව්‍යාපාර අවස්ථාවක් තෝරා ගැනීමේ පියවර දක්වන්න

05. ව්‍යාපාර අදහස් සූක්ෂම විශ්ලේෂණයට භාජනය කිරීම සඳහා සලකා බැලිය යුතු නිර්ණායක මොනවා ද?

06. තෝරාගත් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් පැවතිය හැකි
    ශක්තීන් 03ක්
    දුර්වලතා 03ක්
    අවස්ථා 03ක්
    තර්ජන 03ක් පෙන්වා දෙන්න.

07. ව්‍යවසායකයෙකුට තම නිර්මාණාත්මක ව්‍යාපාර අදහසක් ආරක්ෂා කර ගැනීමට ඇති නීතිමය පහසුකම් කවරේ ද?

පසුගිය විභග ප්‍රශ්න පත්තර ඇසුරින්   සැකසු අභ්‍යාස

1. ව්‍යාපර සංවිදානයක් සම්බන්දව ද්

10.7

ව්‍යාපාර අදහස් හා අවස්ථා ආශ්‍රිත අභ්‍යාස
(පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර ඇසුරිනි)

1) ව්‍යාපාර සංවිධානයක් සම්බන්ධව සලකා බලන විට ශක්තීන් ලෙස ඔබ අදහස් කරන්නේ කුමක්ද?

2) කුඩා ව්‍යාපාරයක දැකිය හැකි ශක්තීන් 2ක් දක්වන්න.

3) විද්‍යාත්මක හා තාක්ෂණික පරිසරය වෙනස්වීම තුලින් පැන නැගී ඇති ව්‍යාපාරික අවස්ථා 2ක් දක්වන්න.

4) හොඳ ව්‍යාපාර අදහසක ලක්ෂණ 4ක් ලියන්න.

5) යම් අයෙකුගේ නව සොයා ගැනීමක් වෙනුවෙන් රජයෙන් ලබාදෙන සහතිකය වන්නේ කුමක්ද?

6) හොඳ ව්‍යාපාර අදහසක් තෝරා ගැනීමේ ක්‍රියාවලියේ පියවර 2ක් සඳහන් කරන්න

7) ව්‍යාපාර අදහස් හා අවස්ථා අතර දැකිය හැකි ප්‍රධාන වෙනස්කම් 2ක් සඳහන් කරන්න.

8) ඔබ කැමති ව්‍යාපාරයක් තෝරාගෙන එහි ශක්තියක් දුර්වලතාවයක් අවස්ථාවක් සහ තර්ජනයක් සඳහා නිදසුන බැගින් දක්වන්න.

9) හොඳ ව්‍යාපාර අදහසක ලක්ෂණ වන්නේ,
   I. අවදානම දැරිය හැකි වීම.
   II. ක්ෂණිකව ලාභ ඉපයීමට හැකි වීම.
   III. වෙනස්වන අවශ්‍යතා හා උවමනාවලට ප්‍රතිචාර දැක්විය හැකිවීම.
   IV. සමාජ පිළිගැනීමක් ලබාගත හැකිවීම.

10) ව්‍යාපාර අදහස් ජනනය වන මූලාශ්‍ර 4ක් දක්වන්න.

11) සුක්ෂම විශ්ලේෂණය යටතේ භාවිතා කල හැකි නිර්ණායකයකි.

I. නිෂ්පාදනය අලෙවි කරගත හැකිය.
II. අවශ්‍ය අරමුදල් සපයා ගත හැකිද?
III. අවශ්‍ය සම්පත් පවතිද?
IV. අමුද්‍රව්‍ය සපයා ගැනීමේ පහසුව.

12) මතුපිටින් සලකා බලමින් වඩා යෝග්‍ය ව්‍යාපාර අදහස් 10ක් පමණ තෝරා ගැනීම හඳුන්වන්නේ?

I. සුක්ෂම විශ්ලේෂණයයි.
II. සාර්ව විශ්ලේෂණයයි.
III. ශද්‍ර අත විශ්ලේෂණයයි.
IV. වෙළඳපොල විශ්ලේෂණයයි.

13) හොඳ ව්‍යාපාර අදහසක් තෝරා ගැනීම පියවර 3කින් යුතු ක්‍රියාවලියකි. මෙහි පළමු පියවර නම් කර එය කෙටියෙන් පැහැදිලි කරන්න.

14) ස්වාධිකාරයක් යනු කුමක්දැයි හඳුන්වා, ස්වාධිකාරයක් ලබාගත හැක්කේ කුමන කාරණා සඳහාදැයි පැහැදිලි කරන්න.

15) හොඳ ව්‍යාපාර අවස්ථාවක ලක්ෂණ 4ක් නම් කරන්න.

16) ව්‍යාපාර අදහසක ලක්ෂණයක් වන්නේ,

I. ව්‍යාපාර අදහස් සුලභ නොවේ.
II. සෑම ව්‍යාපාර අදහසක්ම ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය නොහැකිය.
III. ව්‍යාපාර අදහස් අනාවරණය කර ගැනීම සියල්ලන්ටම කල නොහැකිය.
IV. ව්‍යාපාර අදහස් සීමිතය.

17) ව්‍යවසායකයෙකු තම ව්‍යාපාර සඳහා පවත්නා අවස්ථා හඳුනා ගැනීමට විශ්ලේෂණය කරනුයේ,

I. අභ්‍යන්තර පරිසරයයි. II. බාහිර පරිසරයයි.
III. තරඟකරුවන්. IV. සැපයුම්කරුවන්.

18) බාහිර පරිසරයේ පවතින අවස්ථාවක් වන්නේ,

I. වැඩි පාරිභෝගික පිරිසක් සිටීම.
II. සේවක කැපවීම වැඩිවීම.
III. ආර්ථිකය අයහපත් වීම.
IV. නිෂ්පාදනවල ඉහල ගුණාත්මය.

19) මේවා අතරින් අභ්‍යන්තර පරිසරයේ ශක්තියක් වන්නේ,

I. අමුද්‍රව්‍ය හිඟ වීම. II. සම්පත් නොපැවතීම.
III. දක්ෂ සේවකයන් සිටීම. IV. මූල්‍ය අස්ථාවරත්වය.

20) හොඳ ව්‍යාපාර අදහසක ලක්ෂණයකි.

I. තරඟකාරීත්වයට සාර්ථකව මුහුණ දිය හැකිවීම.
II. තාක්ෂණය සමග නොගැලපීම.
III. මුහුණදෙන අවදානම වැඩිවීම.
IV. පරිසරයේ මතුවන අවශ්‍යතා සපුරා ලිය හැකිවීම.

21) නව සොයා ගැනීමක් යනු,

I. නව නිපැයුමක් බිහි කිරීම.
II. නව යන්ත්‍රයක් හඳුන්වාදීම.
III. නව ක්‍රියාවලියක් ආරම්භ කිරීම.
IV. ඉහත කරුණු සියල්ලේම සංකලනයක් ඇති කිරීම.

22) ව්‍යාපාරයක් ආරම්භකර පවත්වාගෙන යාමේදී ව්‍යවසායකයාට තම වටපිටාවේ ඇති ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන වලට මුහුණදීමට සිදු වේ. මෙහිදී සිදුවන තර්ජනයක් වන්නේ,

I. සම්පත් සැපයීම. II. තාක්ෂණය දියුණුවීම.
III. අනවශ්‍ය දේශපාලන මැදිහත් වීම්. IV. සේවක කැපවීම අඩුවීම.

23) ව්‍යවසායකයෙක් වෙළඳපොල විශ්ලේෂණය සඳහා තොරතුරු ලබා ගන්නා ක්‍රම 4ක් නම් කරන්න.

24) ව්‍යාපාර අදහස් ගණනාවක් අතරින් යෝග්‍ය ව්‍යාපාර අවස්ථාවක් තෝරා ගැනීමට අනුගමනය කරන පියවරක් නොවන්නේ,

I. සූක්ෂම විශ්ලේෂණය. II. සාර්ව විශ්ලේෂණය.
III. ශක්‍යතා විශ්ලේෂණය. IV. අභ්‍යන්තර විශ්ලේෂණය.

- සැකසුම:- කෑ/දෙහි ශ්‍රී සීලනන්ද මහ විද්‍යාලයේ ව්‍යවසායකත්ව අධ්‍යනය
  ගුරු M.V.D.ප්‍රියංගනී ගුරු මහත්මිය විසිනි.
- මූලාශ්‍ර:-10 ශ්‍රේණිය ව්‍යවසායකත්ව අධ්‍යනය පෙළපොත
  පසුගිය විභාගප්‍රශ්න පත්‍ර